## *ඉන්දියානු මහජන යුද්ධයට සහය දීම ජාත්‍යන්තරවාදී කොමියුනිස්ට්වාදීන් බව පෙන්වීමට ඇති මගයි*

අධිරාජ්‍යවාදයට, එහි අර්බුදවලට, එහි යුද්ධවලට, එහි අපරාධවලට එරෙහිව දිළිඳුම ස්ථානයේ සිට පොහොසත්ම ස්ථානය දක්වා වූ ලෝකයේ සෑම රටකම නිර්ධන පංතික සහ ජනතා අරගල, විරෝධය දැක්වීම්, කැරලි ගැසීම් දක්නට ඇත.

ජනතාව එය සිදු කරනු ලබන්නේ විවිධ ආකාරයන්ගෙනි, ඔවුන් සොයාගන්නා අන්තර්ගතයන්ට අනුව ඔවුන්ගේ දැනුවත් බවේ මට්ටම්වලට අනුව, සංවිධානවල ආකාරයන් අනුව, සිරිත් විරිත් සහ සම්ප්‍රදායන්ට අනුවයි.

හැමවිටම අරගලවලට, විරෝධතාවයන්ට, අධිරාජ්‍යවාදීන්ට එරෙහි කැරලිවලට, ඒවා මෙහෙයවන්නන් කොමියුනිස්ට්වරු නොවූවද, එමෙන්ම බොහෝවිට ප්‍රගතිශීලී නොවූවද ජාත්‍යන්තරවාදී කොමියුනිස්ට්වරු ඒවාට සහය දෙයි. නමුත් අධිරාජ්‍යවාදයට එරෙහි අරගල ජනතාවට ජයගත හැක්කේ ඒවා දේශපාලනිකව මෙන්ම යුධමය වශයෙන් පරාජය කිරීමෙන්ම පමණක් බව කොමියුනිස්ට්වරු දනිති. කොමියුනිස්ට් පක්ෂයක් නොමැතිව ජනතාවට අධිරාජ්‍යවාදයට සහ අතවැසි රජයන්ට එරෙහි ජයග්‍රහණයන් ලබා ගත නොහැක. නිර්ධන පංතික සහ කොමියුනිස්ට් නායකත්වයක් යටතේ, ජනතාව විසින් සිදු කරනු ලබන, මහජන යුද්ධයක් නොමැතිව, අධිරාජ්‍යවාදයට එරෙහි බාධා ඇති කිරීම, සටන් කිරීම, පහරදීම සිදු කළ හැක, නමුත් ඔබට ජය ගත නොහැක.

මෙන්න මේ කාරණය නිසා කොමියුනිස්ට්වරු විශේෂයෙන්ම අධිරාජ්‍ය විරෝධී මහජන යුද්ධයක් මෙහෙයවීම සිදු කරන අව්‍යාජ කොමියුනිස්ට් පක්ෂ සමග නැගී සිටිති. මේ අය ඔවුන්ගේ සහෝදරවරු වෙති, ඔවුහු ඔවුන්ට සම්බන්ධ විය යුත්තාහ, ඔවුන් සමග අපේ පොදු යුද්ධය රැගෙන යා යුත්තාහ. අධිරාජ්‍යවාදයට එරෙහි සැබෑ විකල්පය මෙය වන අතර ජය ලබා ගැනීමටද හැකියාව ඇත.

ජාත්‍යන්තරවාදී කොමියුනිස්ට්වරු ලෙස, ඉන්දියාවේ මහජන යුද්ධයට සහ ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ට අපි සහය දෙන්නෙමු, මක්නිසාදයත් එය අද ලෝකයේ වඩාත් වැදගත්ම මහජන යුද්ධය වන නිසායි, ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ලෝකයේ තිබෙන විශාලතම කොමියුනිස්ට් පක්ෂයයි, ඉන්දියාවේ තිබෙන විවිධ සන්දර්භයන් (අන්තර්ගතයන්) හි සිට අපිට ඉගෙන ගැනිමට බොහෝ දේවල් ඇත. ජාත්‍යන්තරවාදයේ සැබෑ ප්‍රකාශ වීමක් ලෙස, අපේ රට තුළ කැරැල්ලක ජයග්‍රහණය මුදුන් පමුණුවා ගැනීමෙන් විප්ලවය කිරීම අපේ අරමුණයි. අපට ලබා දිය හැකි ඉහළම සහයෝගය වන්නේ එයයි.

ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ට සහ මහජන යුද්ධයට, මතවාදී, දේශපාලනික, සංවිධානමය සහය දීමේ සටන වූ කලී අප රටේ විප්ලවය දියත් කිරීම උදෙසා වූ කාර්යභාරයේ අත්‍යාවශ්‍යම වූ අංගයකි.

මෙය වටහා නොගන්නා ඕනෑම අයෙකු, මාක්ස්වාදය-ලෙනින්වාදය-මාඕවාදය විකෘත කරයි, තම තමන්ගේ රටවල්වල විප්ලවය ගැන පමණක් සිතීම වූ කලී නිවැරදි දෙයක් නොවේ, එය එම රටවල්වල ප්‍රතිසංස්කරණවාදයයි, ආර්ථිකවාදයයි, සංශෝධනවාදයයි.

එමනිසා ලෝකය පුරා සිටින පොදුජනයා සහ රටවැසියන් උදෙසා, ලෝකයේ බල සංතුලනය උදෙසා, සමස්ත ලෝකය උදෙසා, ඉන්දියාවේ සිදුවී තිබෙන දෙයෙහි වැදගත්කම ඉක්මවා යන ප්‍රශ්නය වන මහජන යුද්ධයට හෝ ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ට වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ සහය නොදෙන්නා වචනයෙන්වත් ක්‍රියාවෙන්වත් කොමියුනිස්ට්වාදියෙක් හෝ ජාත්‍යන්තරවාදියෙක් නොවේ.

ඉතාලි මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය
pcro.red@gmail.com
ජූනි 2013